# ජාතිය හැඩ ගැසීමට සටන් කළ මෙත්තානන්ද



“නිසැකයෙන්ම ඔහු අවංක මිනිහෙකි. ඔහු ඉහළ තැන්වල වැජඹෙන්නට අදහසක් කෙළේ නැත. උසස් පදවි බලා ගන්නට ගියේ නැත. ඔහුගේ එකම අධිෂ්ඨානය වූයේ ජාතිය ප්‍රබෝධමත් කිරීමටයි. බහුතර පිරිසේ නැති වුණු අයිතිවාසිකම් ලබා දීමටයි. ඒ සඳහා ඔහු පුළුවන් හැම විදියෙන්ම අඛණ්ඩව සටන් කෙළේය”.

ඒ ඊයේ අභාවයට පත් ඇල්. එච්. මෙත්තානන්ද මහතා මීට වසර කිහිපයකට ඉහත දී එක් විචාරකයකු විසින් හඳුන්වනු ලැබූ අන්දමයි.

මෙත්තානන්ද මහතා දේශපාලන කටයුතු අතින් කැපී පෙනුණේය. ජාතික ආගමික සාමාජික අධ්‍යාපනික ආදී කටයුතු අතින් පෙරමුණ ගත්තේය. මෑත යුගයේ මේ හැම කටයුත්තක් ගැනම කතා කරන විට මෙත්තානන්ද යන නාමය ඉබේම සිහියට නැගෙයි.

## ගුරු වෘත්තිය

ලොකු සතු හේවා මෙත්තානන්ද මහජන වැඩ කටයුතු වලට පිවිසුණේ ගුරුවරයකු හැටියට ය. ලන්ඩන් විශ්ව විද්‍යාලයයෙන් උපාධියක් දිනා ටික කලෙකින් පසු ඔහු කොළඹ ආනන්ද මහා විද්‍යාලයයට බැඳුණේය. ඔහු වෙනත් විෂයයන් සමග ලතින් භාෂාවද එහි දී ඉගැන්වීය. 1932 සිට 1936 දක්වා වූ කාලය තුළදී එහි වැඩ බලන අධිපති ධුරය ද ලද්දේය. ඉන් අනතුරුව මහනුවර ධර්මරාජ විද්‍යාලයයේ අධිපති ධුරය ලද්දේය. 1946 දී ඔහු නැවතත් ආනන්දයට ආවේය. ඒ එහි අධිපතිවරයා හැටියටය. 1955 දී විශ්‍රාම ගන්නා තුරුම ඒ පදවිය දැරීය.

## ශූර පාලනය

ධර්මරාජ විද්‍යාලයයේ දීත් ආනන්ද මහා විද්‍යාලයයේ දීත් මෙත්තානන්ද කැපී පෙනුණේය. ධර්මරාජ විද්‍යාලයයේ ඔහු කාලයේ එක් අවස්ථාවක එහි වර්ජනයක් ඇති විණි. මෙත්තානන්ද නොසැලී කටයුතු කෙළේය. ඔහු ආනන්ද මහ විද්‍යාලයාධිපති

**අපේ ලියුම්කරුවකු විසිනි**

පදවිය ලබා එන විට පොලිසියත් එහි ආවේය. ඒ අභිනව අධිපතිවරයා මෙල්ල කළ නොහැකි කෙනකු වූ නිසා නොවේ. එවක එහි කලබලයක් ඇති වී ගොඩනැගිලි වලට ද තර්ජනයක් එල්ල වී තිබුණු නිසාය. එහෙත් වැඩි කල් ගියේ නැත. ඔහුගේ ශූර පාලන හැකියාව හැම අතින්ම දිස් වන්නට විය.

ලංකාවේ අධ්‍යාපනයත්, හැදෙන වැඩෙන පරපුරත් නිසි ලෙස හැඩ ගැස්වීමට ඔහු තුළ වූ දැඩි අධිෂ්ඨානය ගුරුවරයකු හා විදුහල්පතිවරයකු වශයෙන් කටයුතු කළ හැම අවස්ථාවක දීම මනා ලෙස විද්‍යාමාන වූයේය.

එවක රටේ පැවැති අධ්‍යාපන ක්‍රමය කිසිසේත් රටේ දියුණුවට නොගැලපෙන ක්‍රමයක් වූ බව ඔහු හැම විටම පෙන්නා දුන්නේය.

ඒ අධ්‍යාපන ක්‍රමය රටේ ආර්ථික, ජාතික ආගමික, හා සාමාජික ජීවන ක්‍රමයට හැම අතින්ම අයෝග්‍ය බවත්, ඒ නිසා අධ්‍යාපන කටයුතු විෂයයෙහි විප්ලවයක් සිදු විය යුතු බවත් ඔහුගේ විශ්වාසය විය.

මෙත්තානන්ද අධ්‍යාපන කටයුතු අතින් හැම සටනක්ම කෙළේ ඒ විප්ලවය ඇති කරන අටියෙනි.

## අධ්‍යාපන මාධ්‍යය

ඔහු බලවත් විරෝධය පෑ එක් දෙයක් නම් අධ්‍යාපන මාධ්‍යයයි. මේ රටේ ළමයින්ට ඉගැන්විය යුත්තේ ඉංගිරිසියෙන් නොව ස්වභාෂාවෙනැයි මෙත්තානන්ද කියා සිටියේය. ඊට විරුද්ධව කටයුතු කළ ඇතැම් අය වූහ. ඔවුන් වැඩි දෙනා ඉංගිරිසියට ගැති කම් කළ අයයි. ඔවුන් ගේ විරෝධය කොතරම් වීද යත් ඒ සමහරු මෙත්තානන්ද සමච්චලයට ලක් කළහ. ඒ සමහරු ‘ස්වභාෂා මෙත්තා’ යැයි ඔහුට විහිළු නම් ද පටබැන්දහ.

එසේ මෙත්තානන්ද පෙරමුණ ගත් ව්‍යාපාරය අඩපණ නොවීය. එය එන්ට එන්ටම පණ ගැන්වුණේය.

## පෙරමුණ ගනී

එවක පැවැති අධ්‍යාපනය අතින් මෙත්තානන්ද මහතාගේ උග්‍ර විරෝධයට හේතු වූ තව කරුණෙකි. ඔහුගේම වචනයෙන් දක්වතොත් මිෂනාරිවරුන් ගේ බලපෑමයි. “අප ජාතියේ හදවත වන අප අධ්‍යාපනය ඉංගිරිසි ආණ්ඩුව මිෂනාරිවරුන්ට කොන්ත්‍රාත් දීමෙන් ජාතිය දෙකට බෙදුණේ ය. ජාතියේ හදවත අඩ පණ වුණේ” යැයි ඔහු වරක් ලියුවේය.

මෙත්තානන්ද මහතා තවත් අංශයකින් පෙරමුණ ගත්තේය. ඒ භාෂාව අතිනි. ඔහුගේ අධිෂ්ඨානය වූයේ සිංහලය පමණක් රාජ්‍ය භාෂාව වනු දකින්නට ය. ඒ අධිෂ්ඨානය මුදුන් පමුණුවා ගනු පිණිස ඔහු දිගට හරහට රැස්වීම් සංවිධානය කෙළේය. ඒවායේ කතා කෙළේය. පුවත් පත් සඟරා ආදියට ලිපි ලිව්වේය.

ඒ හැම කතාවක්ම කරන ලද්දේ කරුණු පෙන්නා දෙමිනි. හැම ලිපියක්ම මහන්සියෙන් සොයා ගත් වැදගත් තොරතුරු වලින් සම්පූර්ණ වූයේය. ඔහුගේ හැම තර්කයක්ම සවිමත් වූයේය.

## තියුණු පහර

මේ සටන්වලදී ඔහු සමතැන්වාදීන්ට පහර දුන්නේය. සමතැන්වාදීහු ඔහුට පෙරළා පහර දුන්හ. ඔහු පටු හැඟීමෙකින් ක්‍රියා කරන්නේ යැයි සමහරු කීහ. එහෙත් ඔහු ඒ කතාවලට සිනාසුණේය.

වැඩි දෙනා ගේ භාෂා අයිතිය සටන් කළා මෙන්ම සුළු ජනතා භාෂාවට කිසිදු හානියක් කිරීමට තමා අදහස් නොකරන බවත් තමාට උවමනා කරන්නේ වැඩි දෙනා ගේ අයිතිය මෙන්ම ජාතික සමඟිය ආරක්ෂා වන විදියටත් කටයුතු කිරීමට තමන් ගේ කීය.

අනෙක් ජාති හිතෛෂීන් සමග පෙරමුණ ගෙන අධ්‍යාපනය අතින් කළ සටන මෙන්ම භාෂාව අතින් ද ඒ විදියට කළ සටනට ද අන්තිමේ ලැබුණේ විශිෂ්ඨ ජයග්‍රහණයෙකි. ජයග්‍රහණයේ තරම කොපමණ දැයි කියතොත් එදා ඔහු සමච්චලයට ලක් කළ ඇතැම් උදවිය අද ඔහුගේ අදහස් මුදුණින් පිළි ගනිති.

## බොදු අයිතිය

මෙත්තානන්ද මහතාගේ සටන් ව්‍යාපාරයට ලක් වූ තවත් වැදගත් අංගයක් ඇත. ඒ බෞද්ධ අයිතිවාසිකම්ය. මේ සටනේදී ඔහු බෞද්ධ ජාතික බලවේගය නමින් විශේෂ සංවිධානයක් ද ගොඩ නගා “බෞද්ධ පෙරමුණ” නමින් පුවත් පතක්ද පටන් ගත්තේය.

බෞද්ධ ජාතික බල වේගයේ රැස්වීම් රටේ හැම අස්සක මුල්ලකම පැවැත්විණ. මේ ව්‍යාපාරය නිසා නූතන යුගයේ බෞද්ධ ප්‍රබෝධය තව තවත් පණ ගැන්වුණු බව බොහෝ විචාරකයෝ පෙන්වා දෙති.

මෙත්තානන්ද බෞද්ධ තොරතුරු පරීක්ෂක සභාවේ උද්‍යොගිමත් සාමාජිකයෙක් ද වූයේය.

බෞද්ධයන් රටේ බහුතර පිරිසක් වුවත් ඒ අනුව ප්‍රජාතන්ත්‍රවාදීව ලැබිය යුතු අයිතියත් තැනත් යටපත් වී ඇතැයි ඔහු සංඛ්‍යා ලේඛන හා වෙනත් සාක්කි දක්වමින් පෙන්නා දුන්නේය.

## දේශපාලනය

මෙත්තානන්ද දේශපාලන බිමටද බටුයේය. ඔහුගේ දේශපාලන ව්‍යාපාරය අමුතු ස්වරූපයක් ගත්තේය. දේශපාලනය යනු මැති සබයේ අසුනක් දිනා ගන්නට සටන් කිරීම නම් මෙත්තානන්ද කළේ දේශපාලනය නොවේ යැයි වරක් එක් විචාරකයකු කීවේ ඒ නිසාය.

ඔහු 1960 දී කෙලින්ම දේශපාලන රැස්වීම්වල කතා කෙළේය. එහෙත් අනෙක් දේශපාලකයන් මෙන් රැකී රක්ෂා හිඟය, අධික ජීවන වියදම ආදී ප්‍රශ්න ගැන කතා කෙළේ නැත. ඔහු ගේ හැම කතාවකටම වස්තු වූයේ ජාතික සංස්කෘතිය, භාෂාව, බෞද්ධාගම අධ්‍යාපනය ආදී කරුණුයි.

මෙත්තානන්දගේ මූලික අදහස වූයේ මේ රටේම ජීවත් වෙමින් මේ රටටම සේවයක් කිරීමටයි. උසස් පදවි ලැබීමට ඔහු තුළ ආශාවක් නොතිබුණු බව ඔහු සමග කිට්ටුවෙන් ඇසුරු කළ සමහරු පෙන්වා දෙති.

මෙත්තානන්ද මිය යන විට ඔහුගේ වයස 73 කි. ඔහු උපන්නේ 1894 මැයි මස 19 වැනිදා අම්බලන්ගොඩ දීය.